සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයිː
(i) සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) මහා වංසයේ මුල් කොටස ලියවී ඇති භාෂාව කුමක් ද?
(1) සිංහල (2) පාලි (3) සංස්කෘත (4) මාගධී

(02) කෝට්ටේ යුගයේ ලියවුණු පැරකුම්බා සිරිත නම් ග්‍රන්ථය
(1) සන්දේශ කාව්‍යයකි. (2) හටන් කාව්‍යයකි.
(3) ප්‍රශස්ති කාව්‍යයකි. (4) සිලෝ කාව්‍යයකි.

(03) අර්ධ ශුෂ්ක කලාපයට අයත්, ප්‍රාග් ඓතිහාසික තොරතුරු ලබා දෙන ස්ථානයක් වන්නේ,
(1) පාහියන්ගල යි. (2) රාවණා ඇල්ල යි.
(3) බුන්දල යි. (4) මානියම්ගම යි.

(04) විනාශකාරී ගංවතුර පාලනය කිරීමේ තාක්ෂණය නොදත් මුල් ඓතිහාසික යුගයේ ජනතාව තම ජනාවාස පිහිටුවා ගත්තේ,
(1) ගංගාවේ පිටාර නිම්නයට දුරස්ථව ය. (2) කඳුකර ප්‍රදේශවල ය.
(3) ගංගාවේ පිටාර නිම්නයට ආසන්නයේ ය. (4) ගංගා නිම්නයේ ඉහළ කොටසේ ය.

(05) දුටුගැමුණු රජතුමා විසින් පරුමක වරුන්ගේ සහය ලබා ගත්තේ,
(1) මධ්‍යගත බලය විමධ්‍යගත කිරීමට ය. (2) විමධ්‍යගත බලය මධ්‍යගත කිරීමට ය.
(3) ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීමට ය. (4) රටේ ආර්ථික සංවර්ධනය සඳහා ය.

(06) සෙල්ලිපිවල කැති අඩ හා කෙටුකනබ වශයෙන් දක්වා ඇත්තේ,
(1) හේන් වලින් අයකළ බදු ය. (2) ධාන්‍ය මැනීමට භාවිතා කළ ඒකක ය.
(3) කෘෂි කර්මාන්තයට යොදාගත් උපකරණ ය. (4) කාලයක් අතහැර දමා තිබී යටි වගා කළ හේන් ය.

- පහත වගුවේ A සිට H දක්වා දී ඇති තොරතුරු අධ්‍යයනය කොට 7 සහ 8 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රාජධානි යුගය | සබඳතාවය | සබඳතා පැවැත්වූ රට |
|---|---|---|
| A - අනුරාධපුරය | C - පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට යාම | F - රෝමානුක දේශය |
| B - පොළොන්නරුව | D - රුවන්වැලි සෑය අලංකාර කිරීමට වීදුරු පබළු ගෙන්වීම. | G - චේර රාජ්‍යය |
| | E - වේලෛයික්කාර හමුදාවට දළදා වහන්සේගේ ආරක්ෂාව භාර දීම | H - දකුණු ඉන්දියාව |

(07) භාතිකාභය රජු හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) BDE (2) ADF (3) EGH (4) BDF

(08) පළමුවන විජයබාහු රජු හා සම්බන්ධ තොරතුරු සහිත පිළිතුර කුමක් ද?

(1) BDF (2) ADG (3) ACG (4) BEH

(09) පුරාණ කාලයේ ශ්‍රී ලාංකික ජනතාව ආහාර සඳහා නිපදවූ බෝගවලට අමතරව දේශීය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වගා කළ බෝගයක් වූයේ,

(1) කුරුඳු ය (2) පුවක් ය (3) කපු ය (4) දුම්කොළ ය

(10) පහත දක්වා ඇති ''අ'' සහ ''ආ'' තීරු දෙකේ තොරතුරු අතර සබඳතාවය මත ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. පළමුවන උපතිස්ස රජු | A - රෝහල් වලට සම්පත් ලබා දීම |
| 2. බුද්ධදාස රජු | B - පසවන්තිනාමසාලා සෑදීම |
| 3. පස්වන මහින්ද රජු | C - උණ රෝහලක් ඉදි කිරීම |
| 4. හතරවන කාශ්‍යප රජු | D - රෝහල් ඉදි කිරීම |

(1) ABCD (2) BDAC (3) BCAD (4) DBCA

(11)
- කෘත්‍රිමව සාදන ලද කඳු ගැට වලට වැව්බැම්ම සම්බන්ධ කර තිබීම.
- වැව් බැම්මේ දිග සැතපුම් හතක් පමණ වීම.
- අඩි හතලිස් හතරක් පමණ උස වැව් බැම්මක් තිබීම.
- අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටා තිබීම.

ඉහත තොරතුරු ගැලපෙනුයේ පහත සඳහන් කුමන වාරි කර්මාන්තය ද?

(1) යෝධවැව (2) කලාවැව

(3) යෝධ ඇළ (4) පදවිය වැව

(12) ආලාහන පිරිවෙනේ කැණීම් වලින් ලැබී ඇති පහත දැක්වෙන තොරතුරු අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ගොඩනැගිලි ප්‍රමාණයට සරිලන සේ වැසිකිලි තිබිණි.

(2) සංකීර්ණ ශෛල්‍ය කර්ම සඳහා භාවිතා කරන මෙවලම් හමුවිය.

(3) අපද්‍රව්‍ය පිට කිරීම පරිසරයට හානි නොවන අයුරින් සිදු කර ඇත.

(4) අක්ෂි වෛද්‍ය ප්‍රතිකාර ද පැවති බවට තොරතුරු හමු වේ.

(13) ආර්ථික හැකියා පදනම් කොටගෙන බිහිවූ සමාජ ස්ථරායන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වූයේ,

(1) කෘෂිකර්මාන්තය දියුණු වීම යි. (2) සැලසුම් සහගත නගර බිහිවීම යි.

(3) නිෂ්පාදන අතිරික්ත ඇතිවීම යි. (4) ජනයා විවිධ ප්‍රදේශවලට සංක්‍රමණය වීම යි.

(14) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් කාලානුරූපව පෙළ ගැස්සූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A - දළඳා පූජාවලිය රචනා වීම

B - ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය පිහිටුවීම

C - සිංහලසංගෙ නම් කැරැල්ලක් ඇති වීම

D - බෙලිගල දළඳා මැදුරක් ඉදිවීම

(1) BCDA (2) DABC (3) BADC (4) CBAD

(15) කෝට්ටේ ධර්මපාල රජුගේ පියාවූ වීදියේ බණ්ඩාර පෘතුගීසීන්ට එරෙහිව නැගී සිටීමට හේතු වූයේ,

(1) පෘතුගීසීන් පැළැඳ බලකොටුව ආක්‍රමණය කිරීම යි.

(2) බුවනෙකබාහු මරා දැමීමට පෘතුගීසීන් කටයුතු කිරීම යි.

(3) පෘතුගීසීන් කෝට්ටේ රජ මාළිගාව කොල්ල කෑම යි.

(4) ධර්මපාල කුමරු පෘතුගීසීන්ගේ රැකඩ පාලකයෙකු බවට පත්කර ගැනීම යි.

(16) සීතාවක පාලකයින් පෘතුගීසීන් සමඟ කළ සටන් අසාර්ථක වීමට බලපෑ ප්‍රබල හේතුවක් වූයේ මින් කුමක් ද?

(1) සටන්වලදී සීතාවක හමුදාව පෘතුගීසී සමඟ එකතු වීම.

(2) සීතාවක පාලකයන් අතර පැවති බල අරගලය.

(3) සීතාවකට ප්‍රමාණවත් නාවික ශක්තියක් නොවීම.

(4) කෝට්ටේ ජනතාව සීතාවක පාලකයා කෙරෙහි පැවති අප්‍රසාදය.

♦ පහත තොරතුරු ඇසුරෙන් 17 සහ 18 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - දෙල්ගමුවිහාරයේ සඟවා තිබූ දළඳා වහන්සේ මහනුවරට වැඩම කරවීම.

B - වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.

C - පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම.

D - සියම් දේශයෙන් උපසම්පදාව ගෙන්වීම.

E - ගන්නෝරුව සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට පත්කිරීම.

(17) දෙවන රාජසිංහ රජු හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) D හා E (2) C හා D (3) A හා B (4) C හා E

(18) කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) B හා D (2) C හා B (3) B හා A (4) A හා C

(19) උඩරට රාජධානිය ආරම්භයේදී ස්වාධීන සංවිධානයක්ව තිබී පසුව දිසාවේ යටතේ ක්‍රියාත්මක වූ පරිපාලන සංවිධානය වූයේ,

(1) බද්දේ කාර්යාංශය යි (2) රට වසම කාර්යාංශය යි

(3) මහවාසල කාර්යාංශය යි (4) විහාර දේවාල කාර්යාංශය යි

(20) ඉංග්‍රීසි ආණ්ඩුව හා මහජනතාව අතර සබඳතා දුරස්වීමට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනාව කුමක් ද?

(1) සිවිල් සේවකයින් සංඛ්‍යාව අඩු කිරීම

(2) නව අධිකරණයක් ආරම්භ කිරීම

(3) ගමේ පොදුකටයුතු සිදුකළ ගම්සභාව අහෝසි කිරීම

(4) ජනතාවගේ ඉඩම් රජයට පවරා ගැනීම

(21) ක්‍රි.ව. 1848 නිදහස් සටන පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සටනට සම්බන්ධ වූ විශාල පිරිසක් සාමාන්‍ය ජනතාව ය.

(2) සටන්කරුවන්ට නිසි යුධ පුහුණුවක් නොතිබිණි.

(3) සටන උඩරට මෙන්ම පහතරට ප්‍රදේශවලට ද පැතිරිණි.

(4) උඩරට මාර්ග පිළිබඳ ඉංග්‍රීසීන්ට මනා අවබෝධයක් පැවති නිසා සටන මර්දනය පහසු විය.

(22) පහත A සිට D දක්වා දී ඇති ප්‍රකාශ අතුරෙන් අනගාරික ධර්මපාලතුමා හා සම්බන්ධ ප්‍රකාශයක් සඳහන් පිළිතුර තෝරන්න.

A නවකතා මගින් බටහිර සංස්කෘතිය විවේචනය කිරීම.

B ඉන්දීය පූජනීය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම.

C පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම.

D මහා බෝධි සඟරාවට ලිපි සැපයීම.

(1) B සහ C (2) A සහ B (3) B සහ D (4) A සහ D

(23) පොන්නම්බලම් රාමනාදන් මහතා හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පෙරිය පුරාණම් ග්‍රන්ථය පරිවර්තනය කිරීම.

(2) ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවීම.

(3) ලාංකිකයින්ට දේශපාලන බලතල ලබාගැනීමට කටයුතු කිරීම.

(4) ඉංග්‍රීසි ආණ්ඩුව විසින් බෞද්ධයින් මර්දනය කරන විට එයට එරෙහි වීම.

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා කීපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් 24 සහ 25 ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

A - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

B - විධායක ජනාධිපතිවරයෙකු පත්කිරීම

C - පළාත් බද නියෝජනය හඳුන්වා දීම

D - අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

E - සර්වජන ඡන්දබලය ලබාදීම

F - ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

(24) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ යෝජනා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A සහ B (2) A සහ E (3) D සහ E (4) C සහ F

(25) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ යෝජනා දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) D සහ E (2) C සහ D (3) A සහ B (4) D සහ F

(26) ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව, දේශපාලන ප්‍රතිසංස්කරණ ඉල්ලා කරන ලද උද්ඝෝෂණ වල පෙරමුණ ගන්නා ලද්දේ,
(1) පහත රට කම්කරු පන්තිය යි (2) ධනවත් ව්‍යාපාරික පන්තිය යි
(3) උගත් මධ්‍යම පන්තිය යි (4) උඩරට කම්කරු පන්තිය යි

(27) පොල් වගාව අපනයන වගාවක් ලෙස වඩාත් සාර්ථක නොවීමට බලපෑ හේතුවක් වූයේ,
(1) ලංකාවේ භෞතික පරිසරය පොල් වගාවට යෝග්‍ය නොවීම යි.
(2) පොල් වගා හිමියන් වැඩි ප්‍රමාණයක් ලාංකිකයින් වීම යි.
(3) නිෂ්පාදනයෙන් අඩක් පමණ දේශීයව පරිභෝජනය කිරීම යි.
(4) පොල් වගාවට අවශ්‍ය ශ්‍රමය ලබාගැනීම අපහසු වීම යි.

(28) ක්‍රි.ව. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැතිවරයා හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අගමැතිවරයා පත්වනුයේ මහජන ඡන්දයෙනි.
(2) අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා අගමැති වරයා ය.
(3) අගමැතිවරයා විසින් ඇමති මණ්ඩලය පත්කර යි.
(4) අග්‍රාණ්ඩුකාරවරයාට තිබූ බලතල අගමැතිවරයාට ලැබුණි.

(29)
- දෝෂාභියෝග පරීක්ෂා කිරීම
- ඡන්ද පෙත්සම් පිළිබඳ අධිකරණ කටයුතු සිදු කිරීම
- මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු විසඳීම
- පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම පිළිබඳ චෝදනා විමසීම

ඉහත කාර්යයන් සිදුකරනු ලබන්නේ කුමන අධිකරණයක් මඟින් ද?
(1) ශ්‍රේෂ්ඨාධිකරණයෙනි (2) මහාධිකරණයෙනි
(3) මහේස්ත්‍රාත් අධිකරණයෙනි (4) අභියාචනාධිකරණයෙනි

(30) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය පිහිටුවන ලද්දේ
(1) රත්මලානේ ය (2) පල්ලේකැලේ ය (3) කුණ්ඩසාලේ ය (4) ඒකල ය

(31) රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ රටේ ජනතාවගේ අධ්‍යාපනය වෙනුවෙන් සිදුකල විශිෂ්ඨ සේවාව කුමක් ද?
(1) පේරාදෙණිය විශ්ව විද්‍යාලය ආරම්භ කිරීම
(2) විද්‍යාගාර හා පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
(3) රටපුරා පාසල් සංඛ්‍යාව ඉහළ යාම
(4) නොමිලේ අධ්‍යාපනය ලබා දීම

♦ පහත **A,B,C** හා **D** යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවන හා දෙවන අදහස් අතර සබඳතාවය පරීක්ෂා කර බලා 32 - 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - 1. රාජාණ්ඩුව
2. සමූහ ගොවිපල

B - 1. පෞද්ගලික ඉඩම් අයිතිය
2. ස්ටේට් ජනරල් සභාව

C - 1. සරෙයේවෝ සිද්ධිය
2. රතු ඉන්දියානුවෝ

D - 1. බ්‍රිතාන්‍ය ජනපද
2. II ලෝක සංග්‍රාමය

(32) පළමුවැන්න අහෝසි වීම නිසා දෙවැන්නේ ආරම්භය සිදුවීම දැක්වෙන යුගලය
(1) A (2) B (3) C (4) D

(33) පළමුවැන්නේ ව්‍යාප්තියට දෙවැන්න බාධා වීම දැක්වෙන යුගලය

(1) A (2) B (3) C (4) D

(34) පළමුවැන්නේ අකාර්යක්ෂමතාව නිසා දෙවැන්න බිඳ වැටීම දැක්වෙන යුගලය

(1) A (2) B (3) C (4) D

(35) පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවක් නොදැක්වෙන යුගලය

(1) A (2) B (3) C (4) D

(36) ඉතාලියේ හා ජර්මනියේ ජාතික වාදය තුළ දක්නට ලැබුන විශේෂ ලක්ෂණය වූයේ,

(1) තමරට තුළ එකම භාෂාවක් කතාකළ යුතු වීම යි.
(2) තම රටට ආදරය කරමින් අනිත් රටවල් හෙළා දැකීම යි.
(3) වෙනත් ජාතීන් මර්දනය සඳහා සටන් කිරීම යි.
(4) රටේ එකම ජාතියක් පමණක් ජීවත් විය යුතු බව පිළිගැනීම යි.

- පහත A සිට F දක්වා දී ඇති තොරතුර ඇසුරෙන් 37 - 38 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - පැසිස්ට් වාදය යුරෝපයේ ව්‍යාප්ත කිරීම.
B - ජර්මනියට විරුද්ධව යුධ පෙරමුණක් ගොඩනැගීම.
C - ඔස්ට්‍රියානු ජාතිකයෙකු වීම.
D - කළු කමිස හමුදාව පිහිටුවා ගැනීම.
E - චෙකොස්ලෝවේකියාව ආක්‍රමණය කිරීම.
F - ජර්මනිය එක්සත් කොට බලවත් කිරීම.

(37) ඉහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ඇඩොලෆ් හිට්ලර් හා සම්බන්ධ ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) C හා D (3) C හා E (4) D හා F

(38) බෙනිටෝ මුසොලිනි හා සම්බන්ධ ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) D හා E (2) C හා F (3) A හා B (4) A හා D

(39) දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ධනවාදී හා සමාජවාදී කඳවුරු වල නායකත්වය ගත් රටවල් දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රුසියාව හා ඇමරිකා එක්සත් ජනපදය. (2) ඇමරිකා එක්සත් ජනපදය හා රුසියාව.
(3) ප්‍රංශය හා බ්‍රිතාන්‍යය. (4) රුසියාව හා ජර්මනිය.

(40) ''එක්සත් ජාතීන්'' යන්න මුල් වරට භාවිතා කලේ,

(1) ධනවාදී පිළට සම්බන්ධ වූ ජාතීන් ය.
(2) සමාජවාදී පිළට සම්බන්ධ වූ ජාතීන් ය.
(3) අක්ෂ බලවතුන්ට එරෙහිව සටන් වදින්නන් ය.
(4) මිත්‍ර බලවතුන්ට එරෙහිව සටන් වදින්නන් ය.

(ලකුණු 40 × 2 = ලකුණු 80)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කලා ඔය, පාහියන්ගල, පේදුරුතුඩුව, සොරබොරවැව, ගෝකණ්ණතිත්ථ, කලුතර, මැණික් ගඟ, පොම්පරිප්පුව, යෝධවැව, මඩකලපුව, ගම්පොළ, සීගිරිය (ලකුණු 12)

(ii) රතු මුහුද, ගෝව, සිංගප්පූරුව, හිරෝෂිමා, ප්‍රංශය, රෝමය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - උඩරට රාජධානියේ අවසාන රජතුමා

B - ප්‍රංශ විප්ලව සමයේ රට පාලනය කළ රාජවංශය

C - ලංකාවේ ප්‍රථම නාමික විධායක ජනාධිපතිවරයා

D - බ්‍රිතාන්‍යයන් ඇමරිකාවේ පිහිටුවන ලද ප්‍රථම ජනපදය

(ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A රූපය

(ii) (1) A වලින් දැක්වෙන පිංතූරයේ නම ලියන්න.
(2) මෙය ලැබී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?
(3) මෙම නිර්මාණය අයත් වන්නේ කුමන කර්මාන්තයට ද?
(4) මෙය නිර්මාණය කිරීම සඳහා භාවිතා කරන්නට ඇතැයි සැලකෙන තාක්ෂණික උපකරණය කුමක් ද?
(ලකුණු 04)



B රූපය

(iii) (1) B පිංතූරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
(2) එය පිහිටි නගරයේ නම ලියන්න.
(3) මෙම ගොඩනැගිල්ල අයත් වන්නේ කුමන සංවිධානයට ද?
(4) මෙහි පවත්වන ආයතනයෙන් සිදුවන ප්‍රධාන කාර්ය කුමක් ද?
(ලකුණු 04)

## II කොටස

(02) (i) මුල් ඓතිහාසික යුගයේ වැව් කේන්ද්‍ර කොට ගෙන බිහිවූ වාපි ගම්මාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ රජවරුන්ගේ නම් ලියන්න.

A ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක නිරත වීම.

B සෙල්ලිපි වල 'අලකපය මහරජ' නමින් හැඳින්වීම

C පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට චේර රාජ්‍යයට යාම

D චෝළයින් පරාජය කොට පොළොන්නරුව තම අගනුවර කරගැනීම

(ලකුණු 04)

(iii) පූර්ව රාජ්‍ය සමයේ ගම් පාලකයා තෝරා ගැනීමේදී අවධානය යොමු කළ එක් කරුණක් සඳහන් කොට ගම්පාලකයා සතු වූ කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) රටේ ජනතාවගේ අපේක්ෂාවන් ඉටුකිරීමට අතීත රජවරු ගෙන ඇති ක්‍රියාමාර්ග කරුණු තුනක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) සෙල්ලිපි වලින් හමුවන පහත සඳහන් වචන වල අදහස අනුපිළිවෙළින් ලියන්න.

A. වෙජ්ජශාලා B. දසගම් ඇත්තන්

C. වසවසික සභධික (ලකුණු 03)

(ii) ඓතිහාසික සමාජ ධූරාවලිය තුළ A, B, C, D ලෙස ලියා දක්වන්න.

A. ඉහළින්ම සිටින්නා

B. පහළම ස්ථරය

C. සෘජුව නිෂ්පාදන භුක්ති විඳින පිරිස

D. සෘජුවම නිෂ්පාදනයට සම්බන්ධ වන පිරිස (ලකුණු 04)

(iii) පැරණි සමාජයේ ජීවත් වූ විවිධ ජාතීන් සහජීවනයෙන් කටයුතු කළ බව කරුණු දෙකක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) විවධ වූ ආර්ථික කටයුතු වල යෙදුණු ජනතාවක් පැරණි සමාජයේ සිටි බව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) අතීතයේ දිගු දුර මැනීමට යොදාගත් ඒකක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත දක්වා ඇති ප්‍රකාශ වලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. විශාල මැටි බඳුන් බිත්ති වශයෙන් යොදාගෙන සකස් කර ගන්නා ලද ළිං

B. වැවේ ජලය පිටතට ගැනීමට කළ නිර්මාණය

C. බෝධියේ ආරක්ෂාව සඳහා තැනූ ගෘහය

D. සමනල වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණය සඳහා යොදාගත් ගල් වර්ගය (ලකුණු 04)

(iii) මහවැව් නිර්මාණය කිරීමේ ආරම්භක රජුගේ නම සඳහන් කොට මහ වැව් ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) රටේ ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සුරැකීම සඳහා අතීත රජවරු ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටි රාජධානි මධ්‍යස්ථානයක් හා මලය රටේ පිහිටි රාජධානි මධ්‍යස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ගම්පොළ රාජධානි සමයේ වූ විශේෂිත ලක්ෂණ හෝ සිදුවීම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දෙවන නාගරීකරණ සමයේ මෙරට ආර්ථික රටාවේ ඇතිවූ වෙනස්කම් දෙකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු සිදුවූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(06) (i) ඉංග්‍රීසීන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ නගර තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) පහත A,B,C හා D යටතේ දක්වා ඇති තොරතුරු වලට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

A - ක්‍රි.ව. 1795 උඩරට පැමිණ රාජාධි රාජසිංහ රජු හමු වූ ඉංග්‍රීසි දූතයා

B - ඌවවෙල්ලස්ස සටනේදී සටන්කාමීන් අතින් මිය ගිය බදුල්ලේ ඒජන්තවරයා

C - ක්‍රි.ව. 1818 ප්‍රකාශනය නිකුත් කර උඩරට බලය සම්පූර්ණත්වයට පත්කරගත් ආණ්ඩුකාරවරයා

D - ක්‍රි.ව. 1848 අරගලයෙන් පසු කස පහර දී රටින් පිටුවහල් කළ සටන් නායකයා

(රොබට් ඇන්ඩෲස් / ෆෙඩ්රික් නෝර්ත් / ගොංගාලේගොඩබණ්ඩා / ඩග්ලස් විල්සන් / හියුබොයිඩ් / රොබට් චාමස් / රොබට් බ්‍රවුන්රිග් / වීර පුරන් අප්පු)

(ලකුණු 04)

(iii) ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍යය යටත් කරගැනීමේ අවශ්‍යතාවය ඇති වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ක්‍රි.ව. 1848 උඩරට ඇතිවූ නිදහස් සටන් ව්‍යාපාරය පිළිබඳ පහත අසා ඇති තොරතුරු සපයන්න.

a. සටන ආරම්භ වූ ප්‍රදේශය සඳහන් කරන්න.

b. සටනට බලපෑ හේතු දෙකක් ලියන්න.

c. සටන අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) ලංකාවට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ඉල්ලා ඉංග්‍රීසි ආණ්ඩුවට පෙත්සම් ඉදිරිපත් කළ සංවිධාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ වලින් ඉදිරිපත් කළ යෝජනා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භ කිරීමේ අරමුණු දෙකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා ආරම්භ කළ ගොවිජනපද ව්‍යාපාරය ඇසුරෙන් පහත තොරතුරු සපයන්න.

A ආරම්භ කළ පුද්ගලයා

B නිදහස ලැබීමට පෙර පිහිටුවන ලද ගොවිජනපද දෙකක් සඳහන් කරන්න.

C ගොවිජනපද පවත්වාගෙන යාමේදී රජයට මුහුණ දීමට සිදුවූ අභියෝග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) යුරෝපා පුනරුදය නිසා ඇතිවූ චින්තන ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස කතෝලික සභාවේ ආධිපත්‍යය විවේචනය කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A B C D යටතේ දක්වා ඇති ප්‍රදේශ සොයාගත් දේශගවේෂකයින්ගේ නම් සඳහන් කරන්න.

A - සුභ පැතීමේ තුඩුව  B - බටහිර ඉන්දියා දූපත්

C - කැනඩාව  D - පිලිපීනය

(ලකුණු 04)

(iii) (a) පුනරුද සමයේ බිහිවූ ප්‍රතිමා නිර්මාණ දෙකක් සඳහන් කරන්න.

(b) පුනරුද සමයේ කලා නිර්මාණ වල දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍ර වලට පුනරුදයේ බැලපෑම සිදුවිය. දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) (a) ක්‍රි.ව. 1870 ප්‍රංශය පරාජය කර ජර්මනියේ බිස්මාර්ක් විසින් යටත් කරගන්නා ලද ප්‍රංශයට අයත්ව තිබූ ප්‍රදේශ දෙක ද,

(b) ඇමරිකා එක්සත් ජනපදය පළමුවන ලෝක සංග්‍රාමයට අවතීර්ණ වීමට හේතු වූ ජර්මානුවන් විසින් ගිල්වා දැමූ නැවේ නම ද AB අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(ලකුණු 03)

(ii) පහත තොරතුරු වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

A - ජාතීන්ගේ සංගමය පිහිටුවීමට මුල්වූ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා

B - ක්‍රි.ව. 1936 මුසොලිනි විසින් ආක්‍රමණය කළ අප්‍රිකානු රට

C - සුවස් ඇළ ජනසතු කළ මිසර ජනාධිපති

D - අත්ලන්තික් ප්‍රඥාප්තිය අත්සන් කළ බ්‍රිතාන්‍ය අගමැති

(ඇබිසීනියාව, ලොයිඩ් ජෝර්ජ්, මාර්ෂල් ටිටෝ, අබ්දුල් ගමාල් නසාර්, ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්, එරිත්‍රියාව, වින්ස්ටන් චර්චිල්, වුඩ්රෝ විල්සන්) (ලකුණු 04)

(iii) පළමුවන ලෝක සංග්‍රාමයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)


(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිකිරීමේ අරමුණු දෙකක් සඳහන් කොට, ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)


(01) (අ) (i) ප්‍රශ්නය සඳහා

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index No. ……………………



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

## ඉතිහාසය I

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 1 | (21) 3 | (31) 4 |
| (2) 3 | (12) 4 | (22) 3 | (32) 2 |
| (3) 3 | (13) 2 | (23) 4 | (33) 4 |
| (4) 1 | (14) 2 | (24) 2 | (34) 1 |
| (5) 2 | (15) 3 | (25) 4 | (35) 3 |
| (6) 1 | (16) 3 | (26) 3 | (36) 2 |
| (7) 2 | (17) 4 | (27) 3 | (37) 3 |
| (8) 4 | (18) 1 | (28) 2 | (38) 4 |
| (9) 3 | (19) 1 | (29) 1 | (39) 2 |
| (10) 2 | (20) 1 | (30) 4 | (40) 3 |

(ලකුණු 40 × 2 = 80)

## ඉතිහාසය II

(01) (අ) (i), (ii) සිතියමෙහි දක්වා ඇත. (ලකුණු 18)

(ආ) (i) A. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
B. බූර්බෝන්
C. විලියම් ගොපල්ලව
D. වර්ජිනියා (ලකුණු 04)

(ii) 1. පිංතාරු මැටි බඳුන
2. උඩ රංචා මඩමින් / රංචාමඩමින්
3. මැටි කර්මාන්තයට
4. සකපෝරුව (ලකුණු 04)

(iii) 1. ජාත්‍යන්තර අධිකරණය
2. හේග් නුවර
3. එක්සත් ජාතීන්ගේ සංවිධානයට
4. නීති උපදෙස් ලබාදීම (ලකුණු 04)

(02) (i) කඩහවාපී, සුමනවාපී, විහාරවාපී, හුන්දරිවාපී (ලකුණු 03)

(ii) A දුටුගැමුණු B පළමුවන කාශ්‍යප
C පළමුවන ගජබාහු D පළමුවන විජයබාහු (ලකුණු 04)

(iii) ◆ තෝරා ගැනීම
- ★ ගෘහපතීන් අතරින් තෝරාගැනීම
- ★ ධනවතෙකු වීම
- ★ පොදු විශ්වාසය දිනාගැනීම

◆ කාර්යයන්
- ★ පොදු කටයුතු වලට නායකත්වය දීම
- ★ ගමේ වැව නඩත්තු කිරීම
- ★ ගම් ව ැවේ ජලය බෙදා දීම
- ★ ගම් අතර සාමය සහජීවනය පවත්වාගැනීම
- ★ ගමේ ආවාහ විවාහ කටයුතු
- ★ ගමේ ආරවුල් විසඳීම
- ★ භාණ්ඩ හුවමාරුව (ලකුණු 05)

(iv) ◆ රටේ ආර්ථිකය දියුණු කිරීම
- ★ වැව් අමුණු ඇළමාර්ග සෑදීම
- ★ වෙළඳාම සිදු කිරීම
- ★ කර්මාන්ත වලට අනුග්‍රහය

◆ රට වැසියාට ආරක්ෂාව සැලසීම
- ★ දේශීය කැරලි, විදේශ ආක්‍රමණ වලින් රට වැසියා බේරා ගැනීම

◆ ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය ගොඩනැගීම
- ★ භික්ෂූන්ට සිව්පසයෙන් සංග්‍රහ කිරීම
- ★ වෙහෙර විහාර ගොඩ නැගීම
- ★ විවිධ පුද පූජා පැවැත්වීම (ලකුණු 06)

(03) (i) A - රෝහල් B - ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩල
C - වස් සිවුර (ලකුණු 03)

(ii) A. රජු B. දාසයින්
C. ප්‍රභූන් D. සාමාන්‍ය ජනතාව (ලකුණු 04)

(iii) ★ වෙළඳාමට පැමිණි විවිධ ජාතීන් රට තුළ ජීවත් වීම
උදා :- දෙමළ වෙළෙන්දන්, අයෝනියන්වරු, කාම්බෝජවරු, ජාවකවරු

★ දෙමළ ජාතීන් සමඟ සහජීවනය පැවතීම
දෙමළ භික්ෂුවක් සිටීම
දෙමළ සිංහල විවාහ
රාජසභාවේ දෙමළ අධිකාරි තනතුරු
දළඳා වහන්සේගේ භාරකාරත්වය වේලෙයිකාර් හමුදාවට බාරදීම

★ ඉස්ලාම් ජාතිකයින් සමඟ සුහදශීලීව කටයුතු කිරීම
ශ්‍රී පාදය ආදම්ගේ කන්ද
සුලෙයිමාන් ශ්‍රී පාදය වන්දනා කිරීම (ලකුණු 05)

(iv) ◆ කෘෂිකර්මාන්තයේ නියලීම
වී වගාව, හේන්ගොවිතැන
විවධ කර්මාන්ත වල නියැලීම
දේශීය විදේශීය වෙළඳාම
විවිධ වෘත්තීන්, ලපත, චිතකර, කවින් සිටීම (ලකුණු 06)

(04) (i) ගව්ව, යොදුන, උසබ (ලකුණු 03)

(ii) A. ඌරාකැට ළිං C. සොරොව්ව

B. බෝධිඝරය D. ලිමොනයිට්, හෙමටයිට් (ලකුණු 04)

(iii) රජ - වසභ

අරමුණු - කෘෂිකාර්මික සංවර්ධනය

- ගංවතුර පාලනය

- නගර සිසිලනය (ලකුණු 05)

(iv)
- රෝහල් නිර්මාණය ඒවාට උපකරණ සැපයීම
  - ★ දුටුගැමුණු රජු රෝහල් 18 ක් ඉදිකරවීම
  - ★ පණ්ඩුකාභය රජුගේ කාලයේ මාතෘ නිවාස සකස් කරවීම
- රජවරු පවා වෛද්‍ය වෘත්තියේ නිරතවීම ★ උදා :- බුද්ධදාස රජු
- විවිධ රෝගවලට විශේෂිත රෝහල් සැපයීම
  - ★ උදා :- උපසග්ග රෝගනාස
    පසවන්ති නාමශාලා
    ඇස් වෙද රෝහල්
    සර්පවෙද රෝහල්
- ආලාහන පිරිවෙන් කැණීම් වලින් ශල්‍යවෛද්‍ය රෝහලක් හමුවීම.
- අපද්‍රව්‍ය කළමණාකරණය ක්‍රමවත්ව සිදු කිරීම
  ආලාහන පිරිවෙන
- වෛද්‍ය පොත් ලියවීම (ලකුණු 06)

(05) (i) වියළි කලාපයේ - අනුරාධපුරය, පොළොන්නරුව

මලය රටේ - මහනුවර, ගම්පොල (ලකුණු 03)

ii.
- ගම්පොල රාජධානිය තුළ කුඩා රාජධානි කීපයක් තිබීම
- ප්‍රභූ පවුල් බලවත් වීම
- මව් පාර්ශවයෙන් රාජ්‍යත්වය උරුම වීම
- ඉබන් බතුතා ශ්‍රී පාදය වන්දනා කිරීමට ගම්පොළට පැමිණීම
- උතුරේ ආර්ය චක්‍රවර්තීන් බලවත් වීම
- චෙංහෝගේ ආක්‍රමණය සිදුවීම (ලකුණු 04)

iii.
- කෘෂිකටයුතු වලට වර්ෂා ජලය යොදාගැනීම
- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම
- වාණිජ ආර්ථික රටාවකට නැඹුරුවීම
- විදේශ වෙළඳාම වර්ධනය වීම
- විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරය යටතේ තිබීම
- අභ්‍යන්තර කඩවීදි පැවතීම (ලකුණු 05)

(iv)
- රජු පරිපාලයේ ප්‍රධානියා වීම
- රජු යටතේ විවධ නිලධාරීන් සිටීම
- පරිපාලන කාර්යාංශ හතරක් පැවතීම
- රට දිසා 12කට හා රට 9 කට බෙදා තිබීම
- අධිකරණයේ ප්‍රධානියා රජු වූ අතර තනතුරේ ස්වභාවය අනුව අධිකරණ බලතල පැවතීම

(ලකුණු 06)

(06) (i) මදුරාසිය, බොම්බාය, කල්කටා (ලකුණු 03)

(ii) A. රොබට් ඇන්ඩෘස් B. ඩග්ලස් විල්සන්

C. රොබට් බ්‍රවුන්රිග් D. ගොංගාලේගොඩ බණ්ඩා (ලකුණු 04)

(iii)
- ආරක්ෂක වියදම් වැඩිවීම
- උඩරට ස්වාධීන රාජ්‍යයක් තිබීම මුහුදුබඩ පාලනයට බාධාවක් වීම
- පහතරට වැසියන් උඩරට රජු තම රජු වශයෙන් පිළිගැනීම
- පහත රට කැරලි වලට උඩරට රජු උදව් ආධාර දීම
- කොළඹ හා ත්‍රිකුණාමලය අතර සබඳතා අපහසු වීම
- උඩරට හරහා මාර්ගයක් ඉදි කිරීමට රජු අවසර නොදීම (ලකුණු 05)

(iv) a - මාතලේ

b - කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලින් ජනතාවට විවිධ බාධා පැමිණීම
රජයේ බදු ප්‍රතිපත්තිය
නව අධිකරණ ක්‍රමය
රජයේ ඉඩම් ප්‍රතිපත්තිය

c - ඉංග්‍රීසීන්ගේ දැඩි මර්දනකාරි ප්‍රතිපත්තිය
උඩරැටියන්ගේ සම්පත් ප්‍රමාණවත් නොවීම
සටන්කරුවන්ට පුහුණුවක් නොතිබීම
සටනේ මනා සංවිධානයක් නොවීම
සටන ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වීම (ලකුණු 06)

(07) (i) හලාවත සංගමය, යාපනය සංගමය
පහතරට නිෂ්පාදන සංගමය (ලකුණු 03)

(ii) රාජ්‍ය මන්ත්‍රණ සභාව - විධායක කාරක සභාක්‍රමය
සර්ව ජන ඡන්දබලය - රාජ්‍ය නිලධාරීන් තිදෙනා (ලකුණු 04)

(iii) වියලි කලාපීය ගොවිබිම් සංවර්ධනයට ජලය සපයා ගැනීම
ජල විදුලි බලය නිෂ්පාදනය
ඉඩම් හිඟයට පිළියම් ලබා ගැනීම
රැකියා අවස්ථා නිර්මාණය
ගංවතුර පාලනය (ලකුණු 05)

(iv) A ඩී.එස්. සේනානායක මහතා

B මින්නේරිය, කාගම, නාච්චදූව, බෙරගම, මිනිපේ, පරාක්‍රම සමුද්‍රය, රිදී බැඳි ඇල, සංගිලි කනදරාව

C තෙත් කලාපයේ ජනතාව වියලි කලාපයේ පදිංචි කිරීම
ජනතාවට නිවාස පහසුකම් සැපයීම
ජනතාවගේ යටිතල පහසුකම් සැපයීම
නිෂ්පාදන අලෙවි කිරීම (ලකුණු 06)

(08) (i) ජෝන් වයික්ලිෆ්, ජෝන්හස්, ඉරාස්මස්, මාර්ටින් ලූතර් (ලකුණු 03)

(ii) A වස්කෝදගාමා B ක්‍රිස්ටෝපර් කොලම්බස්

C කැබේ සහෝදරයෝ D පර්ඩිනන්ඩ් මැගලන් (ලකුණු 04)

(iii)(a) පියෙටා ප්‍රතිමාව

ලොරෙන්සෝ මේඩි චි ප්‍රතිමාව

මෝසස් ප්‍රතිමාව

දාවිත් ප්‍රතිමාව

(b) නිර්මාණ පෞද්ගලිකව ඉදිරිපත්විම

ලෞකික රසවින්දනය ඉස්මතු වීම

ස්වාධීන දක්ෂතා ඉස්මතු වීම

ස්වභාවිකත්වය ඉස්මතු වීම (ලකුණු 05)

(iv) - ආර්ථික

- ස්වයංපෝෂිත අර්ථක්‍රමය බිඳවැටීම
- යැපුම් කෘෂිකර්මාන්තය බිඳවැටීම
- වතු වගාව ආරම්භ වීම
- ආනයන අපනයන අර්ථක්‍රම
- දුම්රිය මාර්ග මහා මාර්ග බිහිවීම
- බැංකු, රක්ෂණ කටයුතු ආරම්භ වීම (ලකුණු 06)

(09) (i) A ඇල්සාස් සහ ලොරේන්

B ලුසිටානියා (ලකුණු 03)

(ii) A වුඩ්රෝ විල්සන් B ඇබිසීනියාව

C අබ්දුල් ගමාල් නසාර් D වින්ස්ටන් චර්චිල් (ලකුණු 04)

(iii) ජර්මනිය එක්සත් කිරීමේදී ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත්වීම

ජර්මනියේ දෙවන විලියම් අධිරාජ්‍යයාගේ ක්‍රියාකලාපය

යුරෝපා ජාතීන්ගේ යටත් විජිත සඳහා වූ තරඟය

ජාතිවාදය වර්ධනය වීම

බ්‍රිස්මාර්ක්ගේ විදේශ ප්‍රතිපත්තිය

සරායේවො සිද්ධිය (ලකුණු 05)

(iv) -<u>බිහිකිරීමේ අරමුණු</u>

ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගෙනයාම

ජාතීන් අතර මිත්‍ර සබඳතා වර්ධනය

මානව අයිතිවාසිකම් හා මූලික නිදහස තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගය සාක්ෂාත් කිරීම

- <u>ලෝක සාමය ආරක්ෂා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග</u>

ආර්ථික සම්බාධක පැනවීම


න්‍යෂ්ටික අවි සීමා කිරීම හා පාලනය කිරීම


සාම සාධක හමුදාව යෙදවීම (ලකුණු 06)

11 ශ්‍රේණිය

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය / சுட்டெண் / Index No. ....................





N
ප්‍රංශය
රෝමය
රතු මුහුද
ගෝව
හිරෝෂිමා
සිංගප්පූරුව
අප්‍රිකාව
ஆபிரிக்கா
Africa
ඉන්දියන් සාගරය
இந்து சமுத்திரம்
Indian Ocean


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371





































LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්











## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට
**www.lol.lk**
**Learn Ordinary Level**
අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්

ගෙදරටම ගෙන්ව ගන්න

ඔන්ලයින් ඔඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal

NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

